සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 S

# ඉතිහාසය

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- • සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

• 1-15 දක්වා දී ඇති ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. බතාවිය පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය කරගත් බටහිර ජාතිය වන්නේ,
   (i) පෘතුගීසින්ය (ii) ප්‍රංශ ජාතීන් ය (iii) ලන්දේසි ජාතීන්ය (iv) ඉංග්‍රීසි ජාතින්ය
2. ඉන්දියාවේ පාලනය ගෙන ගිය මුගල් අධිරාජ්‍යයේ අවසන් පාලකයා වූයේ,
   (i) ඖරංසෙබ්ය (ii) බාබුර් ය (iii) මහා අක්බාර් ය (iv) ජහන්ගීර්ය
3. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වල අවශ්‍යතාවය පෙන්වමින් විධිමත් සංදේශයක් යටත් ලේකම්වරයාට ඉදිරිපත් කළ මෙරට නායකයෙකු වූයේ,
   (i) පොන්නම්බලම් රාමනාදන් මහතා (ii) සර් ජේම්ස් පීරිස් මහතා
   (iii) පී.සී. පෙරෙයිරා මහතා (iv) පොන්නම්බලම් අරුනාචලම් මහතා
4. වර්ෂ 1795 දී උඩරට රාජධිරාජසිංහ රජු හමුවීමට පැමිණියේ,
   (i) හියු බොයිඩ් ය (ii) ජෝන් ෆයිබස් ය (iii) ජෝන් ඩොයිලි ය (iv) රොබට් ඇන්ඩෲස් ය
5. නීති සම්පාදනය, මූල්‍ය පාලනය කිරීම, මහජන දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම ආදි කාර්යයන් පැවරුනේ මෙරට
   (i) පාර්ලිමේන්තුවටය (ii) ජනාධිපති වරයාටය (iii) කථානායක වරයාටය (iv) අගමැති වරයාටය
6. සර් ඩී. බී. ජයතිලක මහතා පුරෝගාමී වී පිහිටුවන ලද සංවිධානය වන්නේ,
   (i) පරම විඥානාර්ථ සංගමය (ii) අමද්‍යප ව්‍යාපාරය
   (iii) කොළඹ තරුණ බෞද්ධ සංගමය (iv) ජාතික සංගමය
7. කුඩා කල කුණ්ඩසාලේ කුමාරයා ලෙස ප්‍රසිද්ධව සිටි උඩරට රජු වූයේ,
   (i) දෙවන විමලධර්මසූරිය රජු (ii) පළමු විමලධර්මසූරිය රජු
   (iii) සෙනරත් රජු (iv) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු
8. ඉන්දියාවේ හින්දු ජනතාව තුළ ආගමික හා සංස්කෘතික පිබිදීමට ඉවහල් වූ සංවිධානය වූයේ,
   (i) අලිගාර් ව්‍යාපාරය (ii) ප්‍රාර්ථනා සමාජය (iii) බ්‍රහ්ම සමාජය (iv) ආර්ය සමාජය
9. පළාත්බද ඡන්දයෙන් නියෝජිතයින් 23 දෙනෙකු තෝරා පත්කරගනු ලැබුවේ,
   (i) කෝල්බෲක් ප්‍රතිසංස්කරණයෙනි (ii) මැනිං ඩෙවෙන්ශයර් ප්‍රතිසංස්කරණයෙනි
   (iii) මැකලම් ප්‍රතිසංස්කරණයෙනි (iv) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි
10. වර්ෂ 1955 දී ලංකාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබීම සිදු වූයේ,
    (i) සර් ජෝන් කොතලාවල මහතාගේ පාලන කාලයේදී ය.
    (ii) ඩඩ්ලි සේනානායක මහතාගේ පාලන කාලයේදී ය.
    (iii) ඩී.එස්.සේනානායක මහතාගේ පාලන කාලයේදී ය.
    (iv) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ පාලන කාලයේදී ය.
11. විධායක කාරක සභා පිහිටුවීම, වාර්ගික නියෝජනය අහෝසි කිරීම ආදි යෝජනා ඇතුළත් වූයේ,
    (i) මැනිං ප්‍රතිසංස්කරණය තුළය (ii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණය තුළය
    (iii) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය තුළය (iv) සෝල්බරි ප්‍රතිසංස්කරණය තුළය
12. මෙරට වෙල්ලස්ස නිදහස් සටන ව්‍යාප්ත වීමේදී හත් කෝරළයට නායකත්වය දෙමින් සටන මෙහෙයවූයේ,
    (i) මඩුගල්ලේ දිසාවේ ය (ii) බූටෑවේ රටේ රාළය
    (iii) කිව්ලේගෙදර මොහොට්ටාලය (iv) පිළිමතලව්වේ දෙවන අධිකාරම් ය
13. පූජ්‍ය රත්මලානේ ධර්මාලෝක හිමි ආරම්භ කළ පිරිවෙන වන්නේ,
    (i) රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙනය. (ii) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ය.
    (iii) පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ය. (iv) පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන ය.

14. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ බිසව මිය යාම ගැන ශෝකය ප්‍රකාශ කිරීමට උඩරටට පැමිණි ලන්දේසි දූතයා වූයේ,
(i) කලන් අල්බස් ය (ii) කොර්නේලියස් ටැකල් ය (iii) ජෙරාඩ් හල්නේට්ය (iv) ස්පිල් බර්ජන් ය

15. ඉන්දියාවේ මහත්මා ගාන්ධි තුමා විසින් ඉන්ඩිගෝ වගා කරුවන්ගේ දුක් ගැනවිලි විසඳීමට ගෙන ගිය ව්‍යාපාරය හඳුන්වන්නේ,
(i) චම්පරත් ව්‍යාපාරය ලෙසය (ii) ඛෙඩා ව්‍යාපාරය ලෙසය
(iii) සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය ලෙසය (iv) සහයෝගිතා වර්ජන ව්‍යාපාරය ලෙසය

* **16-20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න**

16. ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරයා වූයේ .................................................................................... මහතාය.

17. කෝපි වෙළඳාමෙන් ලද ලාභය අඩු වීම නිසා නව බදු පැනවූයේ ................................................ ආණ්ඩුකාරවරයාය

18. සිපෝයි කැරලිකරුවන් ඉන්දියාවේ අධිරාජයා ලෙස ............................................................ ප්‍රකාශයට පත් කළහ.

19. 19 වන සියවසේ ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය ලෙස ..................................................... ගාල්ලේ පිහිටුවීය.

20. වර්ෂ 1873 දී පමණ මෙරට තේ වගාව පිළිබඳව අත්හදා බැලීම් කරන ලද්දේ ................................................ මහතාය.

(ජෝර්ජ්බර්ඩ්, බහදූර්ෂා, ටොරිංටන් සාමි, මංගල් පාණ්ඩේ, සරසවි සඳරුස මුද්‍රණාලය,
සර් හෙන්රි මන්ක් මේසන් මුවර්, ජේම්ස් ටේලර්, ලංකෝපකාර මුද්‍රණාලය)

* **21-25 දක්වා දී ඇති ප්‍රකාශන හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

21. ලන්දේසි පාලන යුගයේදී නැගෙනහිර වෙරළේ මඩකලපුව දක්වා ප්‍රදේශ යාපන කොමාන්ඩරියට අයත් විය. ( )
22. ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපති ධූරයට පත් වූයේ ජේ.ආර්. ජයවර්ධන මහතාය. ( )
23. ශ්‍රී ආරුමුග නාවලර් තුමා යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කළේය. ( )
24. තිස්සමහාරාම වැව ප්‍රතිසංස්කරණය කළේ හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරයාය ( )
25. ඉන්දියාවේ සම්භාවනීය මහල්ලා ලෙස ප්‍රකටව ඇත්තේ සුරේන්ද්‍රනාත් බැනර්ජි මහතාය. ( )

* **26-30 දක්වා දී ඇති ප්‍රශ්නවල ''අ'', ''ආ'' තීරු නිවැරදිව ගළපා අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ යොදන්න.**

| | | |
|---|---|---|
| 26. සිවිල් හා විවාහ සම්බන්ධ නඩු | ( ) | A - ශ්‍රේෂ්ඨාධිකරණය |
| 27. ප්‍රබන්ධ කථා තුළින් දේශීය සංස්කෘතියේ අගය මතු කිරීම | ( ) | B - අබ්දුල් කලාම් අසාද් |
| 28. ඡන්ද පෙත්සම් පිළිබඳ නඩු විභාග කිරීම | ( ) | C - අනගාරික ධර්මපාල |
| 29. අල්හිලාල් නමින් පුවත්පතක් ආරම්භ කිරීම | ( ) | D - ජෝර්ජ් බර්ඩ් |
| 30. ගම්පල සිංහපිටියේ කෝපි වත්තක් ආරම්භ කිරීම | ( ) | E - පියදාස සිරිසේන |
| | | F - සිවිල් රාද් |

## II කොටස

- **පළමු වැනි ප්‍රශ්නයේ ''අ'', ''ආ'', ''ඉ'' කොටස් තුනටම පිළිතුරු සපයන්න.**
- **II කොටසින් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.**

1. (අ) සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
කලා වැව, යාපනය, කොළඹ, ගල් ඔය (ලකුණු 04)

(ආ) සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
ගෝව, පර්සියන් බොක්ක, පෘතුගාලය, බෙංගාලය (ලකුණු 04)

(ඉ) පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



(1) A - මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුද?
B - උන් වහන්සේගේ ගුරුවරයා වූයේ කවුද?
C - මෙම හිමියන් පිහිටවූ පිරිවෙන කුමක්ද?
D - මෙම හිමි රචනා කළ ග්‍රන්ථයක් ලියන්න.



(2) A - මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
B - එය පිහිටා ඇත්තේකොහේද?
C - එහි ඇති වැදගත්කම කුමක්ද?
D - මෙය ප්‍රසිද්ධියට පත්වූයේ කුමක් නිසාද?

(3) A - සිපෝයි කැරැල්ලේදී ඉංග්‍රීසි භටයකුට වෙඩි තැබූ පුද්ගලයා කවුද?
B - ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති ධූරයට පත් වූයේ කවුරුන්ද?
C - උඩරට රාජාධිරාජසිංහ රජු මුණ ගැසුනු ඉංග්‍රීසි දූතයා කවුද?
D - ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූයේ කවර අගමැති ධූරය යටතේද? (ලකුණු 12)

02. (i) විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරයා විසින් ප්‍රතිසංස්කරණය කළ වැව් දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) උඩරට ගිවිසුමට අත්සන් කළ මෙරට ප්‍රභූවරුන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)
(iii) උඩරට සමගිය බිඳවැටීමට බලපෑ අභ්‍යන්තර බල අරගල දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) ඉන්දියාව තුළ ඉංග්‍රීසින් සහ ප්‍රංශ ජාතිකයන් පිහිටුවා ගත් වෙළඳ මධ්‍යස්ථාන දෙකක් වෙන වෙනම ලියන්න. (ලකුණු 02)
(ii) ඉන්දියානු නිදහස් සටනේ ගාන්ධි තුමා හැර වෙනත් කැපී පෙනෙන නායකයින් තිදෙනෙකු ලියන්න. (ලකුණු 03)
(iii) මහත්මා ගාන්ධි තුමා ඉන්දියාව තුළ ගෙනගිය සටන් ව්‍යාපාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) උඩරට පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි දූතයන් දෙදෙනා ලියන්න. (ලකුණු 02)
(ii) උඩරට රජු හමු වූ අවස්ථා වලදී රජුට ලබාදුන් තෑගි වර්ග තුනක් ලියන්න (ලකුණු 03)
(iii) ලන්දේසින් විසින් මෙරටට හඳුන්වා දුන් උසාවි වර්ග දෙකක් නම් කර එහි කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) බෞද්ධ පුනර්ජීවනය උදෙසා මෙරට එළිදක්වූන ග්‍රන්ථ දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) මෙරට දේශීය සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ පුද්ගලයින් තිදෙනෙකු ලියන්න. (ලකුණු 03)
(iii) හින්දු සහ ඉස්ලාම් ආගමික පුනර්ජීවනයට කටයුතු කළ එක් පුද්ගලයෙකු බැගින් නම් කර ඔවුන් කළ සේවාවන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

06. (i) වර්ෂ 1833 දී හඳුන්වා දුන් කොමිසමෙහි රජයේ ආදායම් වියදම් සහ අධිකරණ කටයුතු විමර්ශනය කළ පුද්ගලයින් දෙදෙනා වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

(ii) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ පත් කළ රාජ්‍ය නිලධාරින් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(iii) සෝල්බරි ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) ඩී.එස්.සේනානායක මහතාගෙන් පසුව වර්ෂ 1970 ට පෙර සිටි මෙරට අගමැතිවරු දෙදෙනෙකු ලියන්න. (ලකුණු 02)

(ii) වර්ෂ 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ අධිකරණ ආයතන 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ ඇති වූ සංවර්ධන ක්‍රියාදාමයන් පහත අංශ යටතේ විස්තර කරන්න.

A - මහවැලි සංවර්ධන ව්‍යාපාරය

B - අධ්‍යාපනයේ දියුණුව

C - සමාජ ශුභසාධනය (ලකුණු 5)

08. (i) වර්ෂ 1857 දී ඉන්දියාවේ ඇති වූ කැරැල්ල නම් කරන්න. (ලකුණු 02)

(ii) එම කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීම පිළිබඳව පහත කරුණු යටතේ විස්තරයක් ලියන්න.

A - ආරම්භක වර්ෂය

B - සංගමයේ ආරම්භක පුද්ගලයා

C - එහි ප්‍රථම සභාපති

D - එහි ක්‍රියාකාරිත්වය (ලකුණු 05)


ශ්‍රී ලංකාවේ ගංගා
Rivers of Sri Lanka
N
Scale



# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## ඉතිහාසය - පිළිතුරු පත්‍රය

**09 ශ්‍රේණිය**

I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | (iii) | 2. | (i) | 3. | (ii) | 4. | (iv) | 5. | (i) |
| 6. | (iii) | 7. | (iv) | 8. | (iii) | 9. | (ii) | 10. | (i) |
| 11. | (iii) | 12. | (iv) | 13. | (i) | 14. | (ii) | 15. | (i) |

16. (මේසන් මුවර්) 17. (ටොරින්ටන් සාමි) 18. (බහදූර්ෂා)
19. (ලංකෝපකාර මුද්‍රණාලය) 20. (ජේමන් ටේලර්)
21. √ 22. × 23. √ 24. √ 25. × 26. F 27. E
28. A 29. B 30. D

II කොටස

1. ලංකා සිතියම/ ලෝක සිතියම
   (ඉ)(i) A- හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (ii) A -මහනුවර මගුල් මඩුව
   B - වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි B -මහනුවර මාළිගා පරිශ්‍රයේ
   C - මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන C -කැටයම් කරන ලද දැවයෙන් නිර්මාණය කළ ගොඩනැගිල්ලක් වීම
   D - කාව්‍යශ්බරය/ සිදත් සඟරා සන්නස D -වර්ෂ 1815 දී උඩරට ගිවිසුම අත්සන් කිරීම
   (iii) A- මංගල් පාණ්ඩේ C -හියු බොයිඩ්
   B- පොන්නම්බලම් අරුනාචලම් මහතා D - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය යටතේ

02. (i) බසවක්කුලම වැව/ තිසා වැව/ කලා වැව/ කන්තලේ වැව/ මැදවච්චිය මහ වැව
   (ii) ගලගම/ගලගොඩ/මිල්ලන්ගොඩ/ මොනරවිල කැප්පෙටිපොල
   (iii) • රජු හා රදල ප්‍රධානීන් අතර • රදල ප්‍රධානීන් අතර
   • රජු හා භික්ෂූන් වහන්සේලා අතර • රජු හා සාමාන්‍යය ජනයා අතර (පිටුව 30)

03. (i) ඉංග්‍රීසි - සුරාට්/ බොම්බාය ප්‍රංශ - පොන්ඩිචේරි
   (ii) කුඩාබායි නවරෝජි/ සුරේන්ද්‍රනාත් බැනර්ජි/ බාල් ගංගාධරන් තිලක්/ අබ්දුල් කලාම් අසාද්/ ජවහර්ලාල් නේරු
   (iii) චම්පරන් ව්‍යාපාරය/ ඛේඩා ව්‍යාපාරය/ සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය/ සහයෝගිතා වර්ජන ව්‍යාපාරය/දන්ඩි පා ගමන (87/88 පිටුව)

04. (i) ස්පීල් බර්ජන්/සීබෙල්ද වර්ට්
   (ii) අශ්වයින් දෙදෙනෙකු/ සඳුන් දව/ දුනු ඊතල කට්ටල දෙකක්/ පෘතුගීසින්ගේ කොඩි/ පර්සියානු බැටලුවන්
   (iii) මහාධිකරණය (රාද් වැන් ජස්ට්ටි) අපරාධ නඩු විසඳීම එහි ප්‍රධානියා හුෆ්ට් අද්මිනිස්තාර්ය.
   සිවිල් උසාවිය - (සිවිල් රාද්) විවාහ සම්බන්ධ නඩු/රික්ස් ඩොලර් 120 ට අඩු අලාභ සම්බන්ධ නඩු විසඳීම ඉඩම් උසාවිය - (ලෑන් රාද්)
   දිසාපති මෙහි සභාපති වරයා විය. ඉඩම් පිළිබඳ නඩු විසඳීම පිස්කල් උසාවි, දිසාවේ උසාවි, ගම්පති උසාවි පහළම උසාවිය විය. විදානේ/ මුදලි/ කෝරාල/ ගම්මුලාදෑනි ආදී න් මෙහි නඩු විසඳීම කළහ.

05. (i) ලක්මිණි පහන/සරසවි සඳරුස/ සිංහල ජාතිය/ සිංහල බෞද්ධයා
   (ii) අනගාරික ධර්මපාල/වලිසිංහ හරිස්චන්ද්‍ර/ පියදාස සිරිසේන/ ජෝන් ද සිල්වා
   (iii) ආරුමුග නාවලර් තුමා/ අරුනාචලම්/ රාමනාදන්/ සිද්දි ලෙබ්බෙ/ ටී.බී. ජයා මහත්වරු (65 - 68 පිටු)

06. (i) ආදායම්/ වියදම් - කෝල්බෲක් සාමිවරයා අධිකරණ - චාල්ස් හේ කැමරන්
   (ii) රාජ්‍ය/නීති/මුදල් ලේකම්වරු
   (iii) • අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම • ආණ්ඩුකාර ධූරය වෙනුවට අග්‍රාණ්ඩුකාර ධූරය පිහිටුවීම
   • ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටුවීම • රාජ්‍ය සේවා කොමිසම පිහිටුවීම
   • අධිකරණ සේවා කොමිසම පත් කිරීම

07. (i) ඩඩ්ලි සේනානායක මහතා/එස්.ඩබ්.ආර්.ඩී. මහතා/ සිරිමාවෝ මැතිණිය/ විජයානන්ද දහනායක මහතා
   (ii) ශ්‍රේෂ්ඨාධිකරණය/ මහාධිකරණය/ දිසා අධිකරණය/ මහේස්ත්‍රාත් අධිකරණය/ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය
   (iii) 131 - 135 දක්වා පෙළපොතේ පිටු

08. (i) සිපොයි කැරැල්ල
   (ii) * සැලැස්මක් නොමැතිකම * නායකත්වයක් නොතිබීම * අවි ආයුධ නොමැති වීම
   * සන්නිවේදනය දුර්වල වීම * ඉන්දියානුවන් කොටසක් ඉංග්‍රීසින්ට සහාය දීම
   (iii) A- 1885 වර්ෂයේදී B -ඇලන් ඔක්ටවියන් හියුම් මහතා C -ඩබ්.සී. බෙනර්ජි මහතා D - 81-82 පිටු
   මධ්‍යස්ථ මත ධාරීන් කටයුතු කිරීම
   (ඩබ්.සී. බෙනර්ජි/දජාබායි නවරෝජි/ සුරේන්ද්‍රනාත් බැනර්ජි ආදීන්) විවිධ ඉල්ලීම් ඉදිරිපත් කිරීම
   (1) ව්‍යවස්ථාදායකය පුළුල් කිරීම (3) සිවිල් සේවයට ඉන්දියානුවන් වැඩිපුර බඳවා ගැනීම
   (2) විධායක සභා බලය ඉන්දියානුවන්ට ලබාදීම (4) යුධ කටයුතු වියදම් අඩු කිරීම
   (5) සිවිල් සේවා විභාගය ඉන්දියාව තුළ පැවැත්වීම යන ඉල්ලීම් කිරීම